www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ජනාධිපතිගේ තවත් පච සාම වෑයමක්

**Another bogus peace move by Sri Lanka's president**

**විජේ ඩයස් විසිනි**
**2006 ජුලි 22**

ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ කල මූලික කතාවක්, රටේ දිගු කාලීන සිවිල් යුද්ධය අවසන් කරනු පිනිස සැබෑ යෝජනා ඉදිරිපත් කිරීමේ කිසිදු අභිප්‍රායක් ශ්‍රී ලංකාවේ ආන්ඩුවට නැති බව යලිත් වරක් පැහැදිලි කර තිබේ.

ව්‍යවස්ථා ප්‍රතිසංස්කරන යෝජනා මාලාවක් කෙටුම්පත් කිරීමෙහි ලා සර්ව පාක්ෂික සමුලුවට (ඒපීසී) සහාය වනු පිනිස තමන් විසින් පත් කරන ලද "විද්වතුන්" 15කින් සමන්විත උපදේශක මන්ඩලයක ආරම්භක රැස්වීම අමතා කල කතාවේ දී, රාජපක්ෂ මොන යම් හෝ සංයුක්ත යෝජනා ගැන හෝ සාකච්ඡා සඳහා නිශ්චිත කාල රාමුවක් ගැන හෝ ඇඟවීම පවා මග හැරියේ ය.

සාමාජිකයන් 15කින් යුත් මන්ඩලයේ සංයුතිය සමස්ත අභ්‍යාසයේ ම ව්‍යාජ ස්වභාවය අවධාරනය කරයි.

දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ සුංගකු ලෙස ක්‍රියා කරන, දිවයිනේ උතුරේ හා නැගෙනහිර මැතිවරන කොට්ඨාශ නියෝජනය කරන, ප්‍රධාන දෙමල පක්ෂයට සර්ව පාක්ෂික සමුලුව සඳහා ආරාධනාවක් වත් ලැබී නැත.

එපමනක් නොව, රාජපක්ෂ පත් කල 12 දෙනෙකුගෙන් සමන්විත ආරම්භක "විද්වත් උපදේශක මන්ඩලයට" ඇතුලත් වූයේ එක් දෙමල ජාතිකයකු පමනක් වන අතර එල්ටීටීඊය සමග කිසියම් බලය බෙදා ගැනීමේ සැකැස්මක් කෙසේ වෙතත්, සටන් විරාම ගිවිසුමට එරෙහිව පවා තර්ක කර ඇති, කුප්‍රකට සිංහල ස්වෝත්තමවාදී නීතිඥයකු වන එච්.එල්. ද සිල්වා එම මන්ඩලයේ ප්‍රධානියා ලෙස පත් කරනු ලැබ ඇත. අවසාන මොහොතේ දී තවත් දෙමල ජාතිකයන් තිදෙනෙකු එයට එකතු කිරීම මගින් එම මන්ඩලයේ පැහැදිලි අසමබරතාව ආවරනය කර ගැනීමේ උත්සාහයක යෙදුනි.

2002 දී තමන් බලයේ සිටි කල එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුම අත්සන් කල ප්‍රධාන විරුද්ධ පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය (එජාප) රැස්වීම වර්ජනය කලේ, එජාප මන්ත්‍රීවරු ආන්ඩුවට එකතු වීමට පොලඹවාලනු පිනිස ඇමති තනතුරු ඇතුලු වාසිදායක අල්ලස් ඔවුන්ට ලබා දීමට රාජපක්ෂ කටයුතු කරන බවට චෝදනා එල්ල කරමිනි.

එය පුදුමයක් ලෙස පෙනිය හැකි වුවත්, පැය තුන් කාලකට වැඩි කාලයක් පැවති සිය කතාව තුල දී රාජපක්ෂ "දෙමල" යන වචනය එක් වරක් වත් සඳහන් නොකලේ ය. එය මතු වූ එකම අවස්ථාව වූයේ දෙමල නායකයන් ඝාතනය කිරීම ගැන ඔහු එල්ටීටීඊයට චෝදනා කිරීම යි.

රාජපක්ෂ සිය කතාව පුරාම "ජාතික ප්‍රශ්නය" හා "අපේ සමස්ත ජනතාව" යන වචන පාවිච්චි කලේ ය. ඒ, දෙමල සුලුතරයට මොන යම් හෝ ප්‍රජාතන්ත්‍රවාදී සහනයක් දීමට රුදුරු ලෙස විරුද්ධ අන්ත සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය සමග තමන් පවත්වා ගෙන යන පාර්ලිමේන්තු සන්ධානය ආවරනය කර ගැනීමේ ප්‍රයත්නයක් ලෙස ය. මෙම සංවිධාන දෙක ම රාජපක්ෂගේ අට මසක පාලන කාලය තුල දී සිවිල් යුද්ධය යලි ඇවිලීමේ දිශාවට ඔහුගේ ආන්ඩුව තල්ලු කිරීමෙහි ලා මූලික ක්‍රියාකලාපයක් ඉටු කර තිබේ.

සිය සන්ධාන හවුල්කරුවන්ගේ අදහස් ප්‍රතිරාවය කරමින්, රාජපක්ෂ සිවිල් යුද්ධය සම්බන්ධයෙන් එල්ටීටීඊයට දොස් පැවරුවේ ය. "එල්ටීටීඊය මගින් ඔවුන් මත පටවන ලද මෙම දශක දෙකක යුද්ධයක් නිසා බොහෝ දුක් කරදර විඳ ඇති උතුරේ හා නැගෙනහිර දුප්පත් ජනයාට ආර්ථික ක්‍රියාකාරිත්වයට සහභාගි වීමේ ඉඩකඩ ලබා දෙන, ඔවුන්ගේ ජීවන අභිලාෂයන් සම්බන්ධයෙන් ප්‍රගතියක් අත්පත් කර ගැනීමේ හැකියාව ඔවුන්ට ලබා දෙන, සුරක්ෂිත, ස්ථාවර හා අර්ථාන්විත වාතාවරනයක් අපි නිර්මානය කල යුතු ය." යැයි ඔහු ප්‍රකාශ කලේ ය.

මානව අයිතීන්වල නියමුවකු ලෙස තමාව ඉදිරිපත් කර ගැනීමට ද ඔහු මෙම අවස්ථාව යොදා ගත්තේ, "ලෝකයේ සැම අස්සක් මුල්ලක් නැර ම ගලා යන මානව අයිතීන් පිලිබඳ සම්මතයන් නොතකා හැරීම අපට කල නොහැකි ය" යැයි අවධාරනය කරමිනි. "එල්ටීටීඊයේ අදහස්වලට ප්‍රතිකූල අදහස් දැරීමේ එකම අපරාධය හේතු කොට ගෙන දෙමල දේශපාලනඥයන් හෝ සෙසු දෙමල නායකයන් නිකරුනේ ඝාතනය කිරීමෙන් පැන නගින මෙම (මානව අයිතීන් පිලිබඳ) කාරනා ගැන අප කරන අවධාරනයට යුක්තියුක්ත පදනමක් තිබේ."

1970 සිට මන්ත්‍රීවරයකුව සිටි, පෙර පැවති ආන්ඩුවල කැබිනට් ඇමතිවරයකු හා අගමැති ලෙස සේවය කර ඇති රාජපක්ෂ, මෙසේ සඳහන් කලේ යඃ "ආනුෂංගික ආන්ඩුව අපගේ ජාතික ගැටලුව විසඳලානු පිනිස මූලිකත්වයන් ගෙන තිබේ. එහෙත් ඒවා එතරම් සාර්ථකත්වයන් අත්පත් කර ගෙන නැත. එමගින් පෙන්නුම් කෙරෙන්නේ අප ජයගත යුතු දුර්වලකමකි. . . . එය කෙතරම් අසීරු කර්තව්‍යයක් වුවත්, පූර්න අවංක භාවයෙන් හා කැපකිරීමෙන් යුතුව, මාගේ උපරිම ශක්තියෙන්, අපගේ සමස්ත ජනතාව වෙනුවෙන් සාමය සඳහා වෙර දැරීම මාගේ අත්‍යවශ්‍ය වගකීම ලෙස මම සලකමි."

උතුරේ හා නැගෙනහිර සංවර්ධන වැඩකටයුතු වෙනුවෙන් හුදු ඩොලර් බිලියන 1.25ක මුදලක් වෙන් කිරීමට රාජපක්ෂ දුන් පොරොන්දුව මගින් මෙම ප්‍රතිඥාවල හිස් බව එලිදරව් විය. මෙය වනාහි 2003 දී පැවැත්වූ ටෝකියෝ සම්මේලනයේ දී සාම ප්‍රතිලාභ ලෙස ආධාර දෙන රටවල් පොරොන්දු වූ අරමුදල්වලින් හතරෙන් පංගුවක් පමනි. නැගෙනහිර වෙරලට දරුනු ම ප්‍රහාරය එල්ල කල 2004 බොක්සිං දින සුනාමිය විසින් සිදු කරන ලද ව්‍යසනය හා බද්ධව, යුද්ධයේ විනාශයට පත්ව ඇති උතුරේ හා නැගෙනහිර මහජනතාව මුහුන දෙන ව්‍යසනයේ කොන්දේසි තුල සැලකූ කල, රාජපක්ෂ වෙන් කල මුදල එම කලාපයේ ජනතාවට කරන අපහාසයකට වඩා වැඩි දෙයක් නො වේ.

කෙසේ වෙතත්, සම්මුතියකට එලඹුන හොත් ලාභ ගැරීම සඳහා පැවතිය හැකි අවස්ථා ගැන කතා කිරීමට ජනාධිපති උනන්දු විය. "යලි ඉදිකිරීමේ වැඩකටයුතුවල යෙදීමට ජාත්‍යන්තර ප්‍රජාවේ පවත්නා කැමැත්ත සහ මෙම (උතුරු හා නැගෙනහිර) ප්‍රදේශවල ආයෝජනය කිරීමට දේශීය ව්‍යවසායන් දක්වන කැමැත්ත සැලකූ කල, කෙටි කාලයක් ඇතුලත ශීඝ්‍ර සංවර්ධනයක් අත්පත් කර ගත හැකි ය." යැයි ඔහු පැවසී ය.

සම්මුතියක් අවශ්‍ය ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කොටස් සමග මෙන් ම සාම ව්‍යායාමයන්ට පිටුබලය දෙන සමහර මහ බලවතුන් ද සමග එක පෙලට සිටීමේ උත්සාහයක් ලෙස, රාජපක්ෂ "මෙම ක්‍රියා දාමය තුල තමන් ද නිමග්න" වන ලෙස එල්ටීටීඊයට කල කැඳවුමක් සිය කතාවට ඇතුලු කර ගත්තේ ය. එහෙත් මෙම සීමිත පියවර පවා ඔහුගේ පාර්ලිමේන්තු හවුල්කරු වන ජවිපෙ වෙතින් වෛරී ප්‍රතිචාරයක් ක්ෂනිකව ම අවුලුවාලී ය.

සිය පෙරමුනු සංවිධානයක් වන දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරය විසින් කැඳවන ලද ප්‍රවෘත්ති සාකච්ඡාවක දී, ජවිපෙ ප්‍රචාරක ලේකම් විමල් වීරවංශ මෙසේ පැවසී යඃ "බොරු සාම කතා පවත්වමින් කාලය නාස්ති කිරීම මල ගෙදරක බූරුවා ගහනවා වගේ තේරුමක් නැති වැඩක්." අවසානය තෙක් කරන සටනකින් ත්‍රස්තවාදය පරාජය කිරීමට ජනතාව මෙහෙයවනවා හැර වෙනත් විකල්පයක් නැත.

දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරයේ සභාපති ගුනදාස අමරසේකර ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී කියා සිටියේ, රටේ පවතින්නේ ජනවාර්ගික ගැටලුවක් වත් යුද්ධයක් වත් නොව ත්‍රස්තවාදයක් පමනක් බව යි. "ත්‍රස්තවාදය පරාජය කිරීමට මුලු රට පුරා යුද මානසිකත්වය ඇති කල යුතු" යැයි ද ඔහු පැවසී ය.

කෙසේ වෙතත්, ජාත්‍යන්තර හා දේශීය මාධ්‍ය රාජපක්ෂගේ ආරම්භකත්වය වර්නනා කලේ ය. *ඇසෝසියේටඩ් ප්‍රෙස්* පල කල වාර්තාවක් මෙසේ සඳහන් කලේ යඃ "මෙම ප්‍රයත්නය වනාහි, 23 අවුරුදු දෙමල නැගිටීම විසඳාලීම සඳහා, නොවැම්බරයේ ඔහු තේරී පත් වීමෙන් පසුව මේ දක්වා රාජපක්ෂ ගත් ප්‍රථම සංයුක්ත පියවර යි."

කොලඹ ආන්ඩුවට අයත් *ඩේලි නිව්ස්* පත්‍රය සිය ජූලි 12 දා කතුවැකියෙන් මෙසේ ප්‍රකාශ කලේ යඃ "මේ රටේ සාමය අගයන කොටස් සාකච්ඡාමය විසඳුමක් සොයා ගැනීමේ ඔහුගේ ප්‍රයත්නයේ දී ජනාධිපති මහින්ද රාජපක්ෂ වටා උද්යෝගිමත්ව රැලි වීම අත්‍යවශ්‍ය ය. ශ්‍රී ලංකාවේ යහ පැවැත්ම හා සන්තුෂ්ටිය හැර අන් කිසිවක් පෙරලා බලාපොරොත්තු නොවෙමින්, ඔහුගේ සාමය ඇති කිරීමේ ප්‍රයත්නයේ දී ජනාධිපතිතුමා වටා මහජනතාව එකතු වුව හොත් අන්තවාදී මත හා සාමයට ඇති සෙසු බාධක ජයග්‍රාහීව මැඩ පැවැත්විය හැකි වනු ඇති බවට කිසිදු සැකයක් නැත."

මෙම උද්ඝෝෂනයේ පීඩනය දැනුනු තතු තුල, එජාපය සිය ආස්ථානය ආපසු හරවාගෙන සර්ව පාක්ෂික සමුලු රැස්වීම්වලට සහභාගි වීමට තීන්දු කල විට, *ඩේලි මිරර්* පත්‍රය ජූලි 13 දා සිය කතුවැකියේ මෙසේ ලිවී යඃ "අවසානයේ දී ඥානවන්ත උපදේශය ජය ලබා එජාපය සර්ව පාක්ෂික සමුලුවේ අනාගත සාකච්ඡාවන්ට සහභාගි වීමට තීන්දු කොට තිබීම දිරිගන්වන සුලු වර්ධනයකි."

ව්‍යවස්ථා යෝජනා කෙටුම් පත් කිරීමට හා සාම සාකච්ඡා සිදු කිරීමට ගත් පූර්ව ප්‍රයත්නන් සියල්ල යුද්ධයේ ඊලඟ අදියර සඳහා ආවරනයක් පමනක් වී ඇත යන කරුන මගින් නිර්මිත සංශයවාදය හමුවේ, මෙම මැත ම අභ්‍යාසය අලෙවි කිරීමේ ආයාසකර උත්සාහයක ආන්ඩුව හා මාධ්‍ය යෙදී සිටී.

පූර්න-පරිමාන යුද්ධය යලි ඇරඹීම සඳහා යලිදු වතාවක් සූදානම් වේ. ආන්ඩුව මිලිටරි පිරිස් බලය ඉහල දමාගනු පිනිස බඳවාගැනීමේ ප්‍රයත්නයන් උත්සන්න කර ඇති අතර සන්නද්ධ හමුදා සඳහා නව, වඩා සූක්ෂ්ම ආයුධ මහා පරිමානයෙන් මිලදී ගැනීමේ ව්‍යායාමයක ද යෙදී සිටී. "උපදේශක මන්ඩලය හා සර්ව පාක්ෂික සමුලුව මත කිසිදු සීමාවක් පැනවීමට ඔහුට අවශ්‍ය නැති නිසා ", ව්‍යවස්ථා ප්‍රතිසංස්කරන කෙටුම් පත් කිරීම සඳහා කාල රාමුවක් නියම කිරීමට ජනාධිපතිවරයාට අවශ්‍ය නැතැයි ආන්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල ප්‍රවෘත්ති සාකච්ඡාවක දී කියා සිටියේ ය.

මේ අතරතුර, "උපදේශක මන්ඩලය" මත සිංහල ස්වෝත්තමවාදීන්ගේ ආධිපත්‍යය පැවතීම යුක්තියුක්ත කිරීමේ කර්තව්‍යය ඩේලි මිරර් පත්‍රය භාර ගෙන ඇත. මැත කතුවැකියකට අනුව, "මෙම විද්වත් මන්ඩලයට පත් කරන ලද සාමාජිකයන් ජාතික ගැටලුව ගැන එකිනෙකට වෙනස් මත දරන පුද්ගලයන් වුවත්, ඔවුහු, වගකිව යුතු පුරවැසියන් ලෙස, වත්මන් තත්වයේ බැරෑරුම්කම දන හොඳින් දන්නා අතර ගැටලුව සම්බන්ධයෙන් සම්මුතියකට පැමිනීමට සමත් විය යුතු ය."

තථ්‍ය වසයෙන් ගත් කල. "උපදේශක මන්ඩලයේ" සංයුතිය මගින් පෙන්නුම් කෙරෙන්නේ. සමස්ත අභ්‍යාසයේ ම ව්‍යාජ ස්වභාවය සහ ගැටුමේ අති මූලික හේතුව වන ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්ථාපිතය තුල මුල් බැස පවත්නා සිංහල ස්වෝත්තමවාදය යන දෙකරුනයි.

© www.wsws.org